D140

# සිංහල නවකතාවේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය;
# ස්ත්‍රීවාදි ප්‍රවේශයක්

ලතා ගුරුසිංහ

2006/Ph.D/ 65

මෙම පර්යේෂණ නිබන්ධය කොළඹ විශ්වවිද්‍යාලයේ දර්ශන විශාරද උපාධි සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.

2016 පෙබරවාරි

සිංහල අධ්‍යයන අංශය

ශාස්ත්‍ර පීඨය

කොළඹ විශ්වවිද්‍යාලය

University of Colombo, Sri Lanka
Library

UCLIB
583485

# හැඳින්වීම

මෙම අධ්‍යයනය සඳහා සිංහල නවකතාව ස්ත්‍රීපුරුෂ සමාජභාවය, ස්ත්‍රීවාදය යන විෂය ක්ෂේත්‍ර පසුබිම් කර ගැනිණ. ස්ත්‍රීවාදී එළඹුමක් මත පදනම් වෙමින් සිංහල නවකතාවේ නිරූපිත ස්ත්‍රීපුරුෂ සමාජභාවය විමසීම මෙහි මුඛ්‍ය අපේක්ෂාව වේ. මක්නිසාද යත් ස්ත්‍රීවාදී දාර්ශනික විශ්ලේෂී ක්‍රමය වන්නේ සෑම සමාජ ගැටලුවක්ම ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව විග්‍රහ කිරීම වන බැවිනි.

ස්ත්‍රීවාදය පිළිබඳ සංකල්පය තුන්වෙනි ලෝකයේ රටවලට තවමත් අවුල්සහගත දෘෂ්ටියකි. 19 වන හා 20 වන සියවස්වල ද බටහිර සමාජයෙහි ස්ත්‍රී ප්‍රශ්න හා බැඳුණු උද්ඝෝෂණ හැඳින්වීමට මෙම වචනය භාවිත කළත් මේ වන විට එය වඩා පුළුල් අර්ථයන් සඳහා යොමු වී ඇත. ඒ අනුව ස්ත්‍රීවාදය ස්ත්‍රීන්ට විරුද්ධව දනට කෙරෙන වෙනස්කම් නැති කිරීම සඳහා සම අයිතීන් හා නෛතික ප්‍රතිශෝධන ඉල්ලා සිටින අතරම සමානාත්මතා සහ විමුක්ති ව්‍යාපාරවලින් ඔබ්බට ගොස්, සමානත්වය සඳහා වන ව්‍යාපාරයක් මෙන්ම පවත්නා ක්‍රමය වෙනස් කිරීමට උත්සාහ කරන වෙනත් ව්‍යාපාර ද ඇතුළත් පුළුල් සංකල්පයක් බවට පත් වී ඇත.

ඒ අනුව ස්ත්‍රීවාදය එක අරමුණක් අනුව පීඩනයෙන් නිදහස්වීමත්, නිවස තුළත්, සමාජයෙහිත් තම ජීවිත පාලනය කිරීමේ බලය තමා සතු කර ගන්නා අතරම ජාතික හා අන්තර්ජාතික වශයෙන් වඩා සාධාරණ සමාජ හා ආර්ථික පිළිවෙළක් බිහි කිරීම තුළින් සියලු ආකාරයේ අසාධාරණකම් හා පීඩනයන් නැති කරලීමටත් අපේක්ෂිතය.

දෘෂ්ටියක් ලෙස ස්ත්‍රීවාදයෙහි විවිධ න්‍යායාත්මක තත්වයන් දකිය හැකිය. කාන්තාවට බලය පැවරීමට, සමානාත්මතාව නිර්මාණය කිරීමට, විමුක්තිය අත්පත් කර ගැනීමට, මර්දනය සහ වෙනස්කම් ඉවත් කිරීමට යන කරුණු මතවාදීමය වශයෙන් ස්ත්‍රීවාදයට ඉලක්ක ගත වේ. ස්ත්‍රීවාදී න්‍යාය ස්ත්‍රී කේන්ද්‍රීය දෘෂ්ටියෙන් වර්ධනය වූ, මානව අත්දැකීම් සහ සමාජ ජීවිතය පිළිබඳ අදහස්වලින් පරිපෝෂිත වූ පුළුල් ලෙස පැතිරුණු සංකල්පයකි.

කෙසේ වුව ද විග්‍රහ කිරීම්වලදී නිර්ණායක විස්තර කිරීම අත්‍යවශ්‍ය වේ. පොත්පත්, ලිපි ලේඛන, දේශන, පත්‍රිකා, කථන වාර්තා කිරීම්, දේශනවලදී පවා ස්ත්‍රිය පිළිබඳ ඍජුවම අදහස් පළවේ. ස්ත්‍රීවාදී සාහිත්‍යය ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ කාර්යභාරය පරිසමාප්ත කිරීමට උත්සුක වේ.

1960 සිට බොහෝ රටවල ස්ත්‍රීවාදය පුනර්ජීවනය ලබා ඇත. ස්ත්‍රීවාදී අධ්‍යයනවලට අදාළව ස්ත්‍රීපුරුෂ සමාජභාව අධ්‍යයන ස්ත්‍රීන්ගේ ඉතිහාසය හා දේශපාලන මෙන්ම ආර්ථික සංවර්ධනය, සමාජ විද්‍යාව, ඉතිහාසය, යනාදියෙහි පසුබිම්

ද සාකච්ඡාවට භාජනය කෙරේ. ඒ හැර ස්වයං චරිතාපදාන, සමාජ තර්කවිතර්ක, ප්‍රකාශනමය කවිය, නවකතාව, කෙටිකතාව පවා ස්ත්‍රීවාදී සාහිත්‍ය විචාර න්‍යායයන් තුළ විමසුමට ලක් කෙරේ.

ස්ත්‍රීවාදී අභිමතාර්ථ දිනා ගැනීමේ පරිශ්‍රමය පසුපස ස්ත්‍රීපුරුෂ සමාජ ගැටලුව පවතී. ස්ත්‍රීපුරුෂ සමාජභාවය යනු ස්ත්‍රියට හා පුරුෂයාට සමාජ තුළින් සංස්කෘතීන් හරහා ආරෝපණය කරනු ලබන තත්වයයි. ස්ත්‍රීපුරුෂ සමාජභාවය න්‍යායාත්මක නිර්ණායකයක් සහ සංස්කෘතික යථාර්ථයක් ලෙස අතීතයේත්, වර්තමානයේත් පවතී. සමාජ විද්‍යාත්මක න්‍යායන් අතර ස්ත්‍රීපුරුෂ සමාජභාවය බටහිර නිපදවීමක් වන අතරම නූතන විචාර සිද්ධාන්තයක්ද වේ. එහිදී Cultural Symbol (සංස්කෘතික සංකේත) normative concepts (ප්‍රතිමානික සංකල්ප) political and social institutions (දේශපාලන හා සමාජ ආයතන) subjective identity (පුද්ගල අනන්‍යතාව) එකට බැඳී පවතී. සංවර්ධනය වෙමින් පවතින රටවල ස්ත්‍රීපුරුෂ අසමානතාව නිර්මාණය වීමට හේතු වන කරුණු අතර පිතෘමූලික ආකල්ප හා නූතනත්වය පිළිබඳ ගැටුම් ද වේ. පිතෘමූලික සමාජය යනු ස්ත්‍රීන් යටපත් කොට ගෙන පුරුෂයන් ආධිපත්‍ය පෑම නොව පද්ධතිගත ව්‍යුහයක් ලෙස පවතින්නකි. පිතෘ මූලික මතවාද (patriarchal Ideology) සහ පුරුෂ මූලිකත්වය (male dominated) යන සංකල්පවලට ස්ත්‍රීවාදීහු දැඩි ලෙස අභියෝග කරති.

ස්ත්‍රීපුරුෂ සමාජ අසමානතාව, ස්ත්‍රීපුරුෂ සමාජ වෙනස්කම් මර්දනය වැනි බොහෝ අංග පිතෘමූලිකත්වයේ නිපයුමකි. මෙම නිර්ණායක පසුබිම් කර ගනිමින් නිබන්ධය රචනා කෙරිණ. මෙම කරුණු සියල්ලම පදනම් කර ගත් ස්ත්‍රීවාදය හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය විෂය ක්ෂේත්‍ර ඇසුරින් සිංහල නවකතාව පර්යේෂණාත්මක විමසීමකට භාජනය කෙරේ. නවකතාව වූ කලී අතිශයින් සංකීර්ණ කලා මාධ්‍යයකි. එය සමාජය ගැඹුරු ලෙස පිළිබිඹු කරයි. ගැඹුරු මානව අත්දැකීම්, ව්‍යක්ත භාෂා මාධ්‍යයන් හා තේමාවන්ට සරිලන සන්දර්භ හා රීතී උපයෝගී කර ගනිමින් පාඨකයා වෙත ඉදිරිපත් කිරීමට ප්‍රතිභාසම්පන්න නවකතාකරුවෝ උත්සුක වෙති.

පසුගිය දශක කිහිපය ඇතුළත පෙරදිග මෙන්ම අපරදිග රටවල චින්තන ලෝකය කෙරෙහි ස්ත්‍රීවාදී විචාරය දැඩි ලෙස බලපා තිබේ. ආරම්භයේදී ප්‍රගතිශීලි සමාජ බලවේගයක් වූ මෙය පසුව බුද්ධිමය බලවේගයක් බවට පත්විය. ස්ත්‍රීවාදී විචාරකයන්ගේ පරිශ්‍රමයන්හි ප්‍රතිඵලයක් වශයෙන් සමාජ විශ්ලේෂණයන්හි වහල් කොට ගනු ලබන ප්‍රමිති පිළිබඳ මහත් පරිවර්තනයක් සිදුවී ඇත.

දහහත් වන සියවසෙහි පටන් අපරදිග රටවල ස්ත්‍රීවාදී චින්තනය වාචිකව පැවතිය ද එය විධිමත් සාමාජික ව්‍යාපෘතියක් ලෙස වර්ධනය වූයේ 1960 ගණන්වල සිටය. වැඩිකලක් ගතවීමට පෙර මෙම චින්තන ප්‍රවාහය සාහිත්‍ය අධ්‍යයනය, සමාජ

විද්‍යාව, දේශපාලන විද්‍යාව, ඉතිහාසය, චිත්‍රපටි අධ්‍යයනය, සංස්කෘතික අධ්‍යයනය වැනි විවිධ ශික්ෂණ මාර්ග කෙරෙහි බලපාන්නට විය. 1970 සිට ගවේෂණ මාර්ගයක් වශයෙන් ඉතිහාසය පුරුෂ කේන්ද්‍රීය ලක්ෂණ ස්ථාපනය කිරීමට අනුබල දෙන බව ස්ත්‍රීවාදීන්ගේ විශ්වාසය විය. 1970 පමණ වන විට ස්ත්‍රීපුරුෂ භේදය පිළිබඳ සංකල්පද සාකච්ඡාවට ගැනිණ.

ඉහත කරුණු පදනම් කර ගනිමින් පර්යේෂණ ගැටලුව සකස් කර ගැණින. සිංහල නවකතාවල ස්ත්‍රිය නිරූපණය කොට ඇත්තේ කවරාකාරයෙන් ද? ඔවුනට පිරිමින්ට හා සමාන තත්වයක් ලබා දී තිබේ ද? සිංහල නවකතාවෙන් ස්ත්‍රියගේ යථා තත්වය යටපත් කොට තිබේ ද? ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය ස්ත්‍රීවාදී පර්යාවලෝකයන් (Perspective) සිංහල නවකතාවෙහි විද්‍යමාන වන ආකාරය සියුම් විශ්ලේෂණයකට භාජනය කෙරේ.

සිංහල නවකතාව පිළිබඳ විවිධ දෘෂ්ටිමය පරාසයන් මත තබා සාකච්ඡා කළ ද නූතන විචාර න්‍යායන් අතර ප්‍රබලව සාකච්ඡා කෙරෙන ස්ත්‍රීවාදී විචාරය මෙතෙක් විමසුමට ලක් වී නැත. ස්ත්‍රීත්වය යන සංකල්පයෙහි නියම අර්ථය පහදා දීමටත්, එය පුරුෂ කේන්ද්‍රීය සමාජවල බලයට හා ආධිපත්‍යයට නතුවී ඇති ආකාරයත් පැහැදිලි කිරීමට උත්සහ කරන ස්ත්‍රීවාදීන්ගේ අරමුණ මතු කිරීමත් මෙහි පරමාර්ථයක් වේ.

සමකාලීන ස්ත්‍රීවාදී න්‍යායන් වර්ග කිරීම ගැටලුසහගතය. සිංහල නවකතාවේ නිරූපිත ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයනයේදී විශ්ලේෂණාත්මක උපකරණයක් (Analytical tool) වශයෙන්ද ස්ත්‍රීවාදය (Feminism) යන න්‍යායයේ ක්‍රමවේදීය අදාළත්වය විමසා බැලේ. ස්ත්‍රීවාදය යනු මහා න්‍යායකි. සමකාලීන ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලුව ස්ත්‍රීවාදය මුහුණපාන වැදගත් දාර්ශනික ප්‍රශ්නය වී තිබේ. එනම් ස්ත්‍රිය යනු කවරෙක් ද? පුරුෂයාගේ හා ස්ත්‍රියගේ හරය එක හා සමාන ද? එසේ නොවේනම් වෙනස් වන්නේ ද? සමානාත්මතාව පිළිබඳ සංකල්පය ගොඩනැගිය යුත්තේ සමානකම් පදනම් කොටගෙන ද? එසේ නොවේනම් වෙනස්කම් පදනම් කොටගෙන ද? සමාජ මතවාදය තුළ මෑත ඉතිහාසයෙහි ඉතාම දැඩි අභියෝගයට ලක් කෙරුණු එමෙන්ම ඒ සඳහා දැඩි විරෝධතාවක් සමාජ මතවාදය තුළම පැන නැගුණු වැදගත් සමාජ අසමානතාවක් වන්නේ ස්ත්‍රීපුරුෂ සමාජභාවයි.

ස්ත්‍රීපුරුෂභාවය (Sex) යනු ඉතා පැහැදිලි ජීව විද්‍යාත්මක වෙනසක් වුව ද නූතන සමාජ මතවාදය තුළ වැදගත්ව ඇත්තේ මෙම ජීව විද්‍යාත්මක වෙනස්කම් නොව ස්ත්‍රීපුරුෂ සමාජභාව (Gender) සමාජීය වශයෙන් ගොඩනගන ප්‍රභේදයයි. මේ අනුව ගැහැනු හා පිරිමි දරුවන් උපත ලැබූ අවස්ථාවේ සිටම පසු කරන සෑම ජීවන අවධියකම මේ විභේදනය සමාජය තුළින් අපේක්ෂා කෙරේ. මේ සඳහා මූලික වන ආයතනය පවුල වේ. අධ්‍යාපනය, ආර්ථිකය, දේශපාලනය, ආගම, සංස්කෘතිය,

ජනමාධ්‍ය, නීති ඇතුළු සමාජ හැසිරීමට බලපාන සෑම සමාජ අංශයක්ම ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කර ගත් මතවාදයක් දැකිය හැකිය. මේ සියලුම සාධක මත සිංහල නවකතාව විශ්ලේෂණය කිරීම දෙවන අරමුණ වේ.

මෙම නිබන්ධය සඳහා තෝරාගත් මාතෘකාවට නූතන සිංහල සාහිත්‍යයට කොතෙක් දුරට වැදගත් වේ දැයි පළමුව විමසා බැලිය යුතුව ඇත. ස්ත්‍රීවාදය, ස්ත්‍රීපුරුෂ සමාජභාවය, සිංහල නවකතාව යන විෂය ක්ෂේත්‍ර පුළුල් අධ්‍යයන පසුබිමක සාකච්ඡාවට ලක්ව නැත. ස්ත්‍රීවාදයේ විවිධ වූ න්‍යායාත්මක ප්‍රවේශ දැකිය හැකිය. Feminist social theory, Feminist Theory and economic change, Feminist political theory, Feminist Jurisprudence, Feminist Anthoparology, post colonial Feminist theory, Lesbian theory, theorizing gender and sexuality, Feminist Linguistic theories, Psychoanalytic theory, Feminist literary theory, Feminist media and film theory ඉන් කිහිපයකි. ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ ලිංගිකත්වය පිළිබඳ න්‍යාය ස්ත්‍රීවාදය සමග ඍජුවම සම්බන්ධ වේ.

කෙසේ වුවද මේ විෂය සම්බන්ධව ලංකාවේ සිදුව ඇති අධ්‍යයන ඉතා අල්පය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලියවී ඇති කෘති තරමක් තිබුණ ද සිංහලෙන් රචනා වී ඇත්තේ අඩුවෙනි. රාජ්‍ය නොවන සංවිධාන හා කාන්තා සංවිධාන විසින් කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයන හා පරිවර්තන පමණක් මෙයට අදාළ වේ. ඒවා ද සිදු කෙරී ඇත්තේ ඉංග්‍රීසි භාෂාධ්‍යයන ඇසුරින් අධ්‍යයන කටයුතු  සිදු කරන සීමිත පිරිසක් වෙතිනි. ශාස්ත්‍රාලීය කතිකාවකට සීමා වී තිබීමද මෙහි තවත් දුර්වලතාවකි. එහෙත් මේ වන විට ලෝකයේ බොහෝ රටවල සාහිත්‍ය ඉතිහාසය ස්ත්‍රීපුරුෂ සමාජභාවී හා ස්ත්‍රීවාදී ආස්ථානවල සිට නැවත කියවීම නිසා අතීතයේ සැඟවී තිබුණු ස්ත්‍රීන්ගේ සාහිත්‍යයික දායකත්වය ඇගයීමට හැකි වී තිබේ. එහෙත් ශ්‍රී ලංකාවේ නම් මෙම දායකත්වය පිළිබඳ සාකච්ඡා වී නැති තරම්ය. ස්ත්‍රීවාදය හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය සම්බන්ධව සාහිත්‍යයික විචාරනයකට කාලය උදා වී ඇත. මෙම අවශ්‍යතාව සපුරාලීම අධ්‍යයනයේ ප්‍රධාන වැදගත්කම වේ.

සිංහල නවකතාවක් ලියා ප්‍රසිද්ධ කළ ප්‍රථම ස්ත්‍රිය ලෙස සඳහන් වන්නේ 1927 දී ''සිංහල ලන්සි විවාහය" නම් නවකතාව පළ කළ ස්වර්ණලතා වඩුගේ කුමාරිහාමිය. විසිවන සියවසෙහි බිහි වූ ස්ත්‍රීන්ගේ ඡන්ද අයිතිය දිනා ගැනීමේ ව්‍යාපාරය වැනි ආරම්භක ස්ත්‍රී විමුක්ති ව්‍යාපාර ඉංග්‍රීසි උගත් ඉහළ පැලැන්තියේ ස්ත්‍රීන්ට සීමා විය. මෙය එකල සිංහල මධ්‍යම පංතිය හා ධනේශ්වරය තුළ පැවති දැඩි ස්ත්‍රීපීඩක සම්ප්‍රදායන්වල එක් බලපෑමක් විය හැකිය. අවශ්‍යයෙන්ම ආගමික නොවන නවකතා, කෙටිකතා කියවීම ස්ත්‍රියට තහනම් කිරීමක් සිදුවිය. මෙසේ කලාව තිරශ්චීන ප්‍රපංචයක් බවට පත්කිරීම නිසා ස්ත්‍රීන් ඇතුළු සමාජයේ අනෙකුත් දුර්වල කොටස්වල කලාත්මක ජීවිතයට එම තත්වය අනර්ථකාරී ලෙස බලපෑවේය.

පළමුවෙනි ප්‍රබන්ධ කතාව වී ඇත්තේ 1876 එච්. කන්නන්ගර දේවගැතිතුමාගේ "ග්‍රාම ප්‍රවෘත්තියක්" නම් කෘතියයි. 1897 සිට 1927 දක්වා ප්‍රබන්ධ කතා 139 ක් පළ වී ඇත. ස්ත්‍රීත්වය ලේඛන කාර්යයට බාධාවක්ව තිබූ ආකාරයට මෙය හොඳ නිදසුනකි. ස්වර්ණලතා වඩුගේ කුමාරිහාමිගේ "සිංහල ලන්සි විවාහය" නවකතාව ලංකාවේ පළ වූ 140 වැනි නිර්මාණය වීමම ස්ත්‍රීපුරුෂ භේදයේ සීමා මායිම් තහවුරු කරයි. (Gender discrimination begins with the child) ස්ත්‍රීවාදී කතිකාව තුළ ඉහත විෂයන් පිළිබඳ අල්ප දැනුමක් පැවතීමත්, එය ස්ත්‍රිත්වය සම්බන්ධ නිශේධනීය ආකල්පයක් වීමත් මෙම අධ්‍යයනයේ වැදගත්කමට හේතුවක් වේ.

ස්ත්‍රීවාදය හා සම්බන්ධ වූ විවිධ න්‍යායන් සඳහන් කළ අතර ස්ත්‍රීපුරුෂ සමාජභාවය ද විවිධ ප්‍රභේද යටතේ හඳුනා ගත හැකිය. බටහිර ධනේශ්වර ශිෂ්ටාචාරයේ ප්‍රතිඵලයක් වන මෙය ඓතිහාසිකව විවිධ සමාජ සංස්කෘතින්ගේ සැකැස්ම තුළ වර්ධනය වී ඇත. ස්ත්‍රිත්වය හා පුරුෂත්වය නිර්ණය වන්නේ සමාජ සංස්කෘතික හා දාර්ශනික ප්‍රතිමාන තුළය. ජීව විද්‍යාත්මක ලිංග වෙනස ස්වාභාවික සංසිද්ධියක් වන අතර එහිදී පුරුෂයාගෙන් ස්ත්‍රිය වෙනස් වන ප්‍රධානතම ලක්ෂණය වන්නේ ස්ත්‍රිය සතු දරුවන් බිහි කිරීමේ හැකියාවයි. මෙම ප්‍රාථමික ලිංගයට අමතරව තවත් ද්විතීයික ලිංගයක් පවතී. ගැටලුව වනුයේ ලිංග අතර වෙනස නොව ද්විතීයික ලිංග අතර වෙනසයි. මෙය ඓතිහාසික, සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලන ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. ද්විතීයික ලිංගිකත්වය යනු ඓතිහාසික නිෂ්පාදිතයකි. එය නිශ්චිත සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික කොන්දේසි සමග බැඳී පවති. එහි අර්ථය නම් අදාළ සමාජයේ සමාජ, ආර්ථික, සංස්කෘතික ගති ලක්ෂණවලින් එම සමාජය තුළ ජීවත් වන ස්ත්‍රීන් හා පුරුෂයන් අතර සබඳතාවට කරන බලපෑම විමසීමයි. පිතෘ මූලිකත්ව ප්‍රශ්නයක් (The trouble with patriarchy) ලෙස ඵලදායි ඓතිහාසික විග්‍රහයක් (A useful category of Historical Analysis) පශ්චාද් නූතනවාදී නිර්ණායකයක් (Post modern category) පන්තිය (Class) ජාතිය (Nation) සමාජ ස්තර (Stratification) පමණක් නොව ආගම, දේශපාලනය, සාහිත්‍යය, නීතිය, භාෂාව, සංස්කෘතිය, අධ්‍යාපනය, ආර්ථිකය යනාදී විවිධ න්‍යායාත්මක ප්‍රවේශයන් සමඟ බැඳී පවති. මෙම අධ්‍යයනය තුළින් ස්ත්‍රීපුරුෂ සමාජභාව පිළිබඳ පුළුල් විග්‍රහයක් කළ හැකි වේ. ස්ත්‍රීවාදී සාහිත්‍යය සම්බන්ධයෙන් කිසිදු ආකාරයක පුළුල් අධ්‍යයනයක් සිංහල සාහිත්‍යය ඇසුරින් මෙතෙක් සිදුවී නොතිබීමම මෙහි අවශ්‍යතාව තහවුරු කෙරේ.

ස්ත්‍රීපුරුෂ සමාජභාවය නම් සංකල්පීය රාමුව (conceptual frame of gender ) ඔස්සේ සිංහල නවකතාව න්‍යායාත්මක (theoretical) මෙන්ම අධ්‍යයනික (Acadamic) ක්‍රමවේදයෙන් සාකච්ඡා කෙරේ. 1960 දශකයේ සිට 2000 වසර දක්වා සිංහල නවකතාවට දායකත්වය ලබා දුන් ලේඛක ලේඛිකාවන් දහ දෙනා බැගින් තෝරා ඔවුන්ගේ සියලුම නවකතා මූලාශ්‍රය කොට ගැනිණ.

අධ්‍යයනයට සෘජුවම අදාළ වන, අදාළ නොවන දැනට ප්‍රකාශිත පොත්පත් සඟරා හා වෙනත් ලේඛන මඟින් මෙන්ම අන්තර්ජාලයෙන් ද කරුණු රැස් කර ගැනීමක් සිදුවේ. මේවා සියල්ලම ද්විතීයික මූලාශ්‍රය ගණයට අයත් වේ. මෙම පර්යේෂණයේ තවත් වැදගත් කොටසක් වනුයේ ප්‍රාථමික මූලාශ්‍රයි. තෝරාගත් ලේඛක ලේඛිකාවන්ගේ සියලු නවකතා සාකච්ඡාවට ලක් කෙරේ. එමෙන්ම සමාජ, ආර්ථික, නෛතික, සංස්කෘතිය සම්බන්ධ දත්ත ලබා ගැනීම සඳහා ද ආයතනික වශයෙන් තොරතුරු රැස් කෙරේ.

වර්තමාන ලාංකේය කාන්තාව යම් නිදහස් තත්වයක් ඇති කර ගෙන සිටියද ඉතිහාසයේ සිට ඇය තවමත් වෙනස්කම්වලට (Discrimination) භාජනය වේ. මේ තත්වය සමාජ විද්‍යාඥයන්ගේ හා විවිධ පර්යේෂකයන්ගේ විශේෂ අවධානයට යොමු වී ඇත. මේ නිසාම නූතන පර්යේෂණවල වැදගත් ක්ෂේත්‍රයක් ලෙස කාන්තාව පිළිබඳ අධ්‍යයන ඉදිරියට පැමිණ තිබේ.

ජාත්‍යන්තර කාන්තා වර්ෂයත් සමඟ ශ්‍රී ලංකාවේ කාන්තාවන් පිළිබඳ පර්යේෂණ කටයුතුවල ව්‍යාප්තියක් සිදු විය. විශේෂයෙන් 1978 නොවැම්බර් මාසයේදී සැලසුම් කිරීමේ අමාත්‍යාංශය මඟින් ''කාන්තා කාර්යාංශය'' පිහිටුවීමත් සමඟ කාන්තාව පිළිබඳ පර්යේෂණ කිරීමට, තොරතුරු ලබා ගැනීම හා තොරතුරු ව්‍යාප්ත කිරීම ද සිදු විය.

කොළඹ විශ්වවිද්‍යාලයේ ආයතනික අනුග්‍රහය යටතේ ස්වර්ණා ජයවීරගේ සම්බන්ධීකාරකත්වයෙන් statues of woman Srilanka (1979) පර්යේෂණාත්මක අධ්‍යයනය ස්ත්‍රිය පිළිබඳ ව කරන ලද පූර්ණ අධ්‍යයනයකි. එහිදී සමාජ, සංස්කෘතිය, නීතිය, සාහිත්‍ය, ජනමාධ්‍ය, අධ්‍යාපනය, රැකීරක්ෂා, දේශපාලනය, සෞඛ්‍යය යනාදී විවිධ විෂය ධාරා ඔස්සේ සාකච්ඡා කර ඇත. එහි දී විවිධ විෂය ධාරා ඔස්සේ ස්ත්‍රිය පිළිබඳ අධ්‍යයන සිදූවී තිබුණ ද ස්ත්‍රීපුරුෂ සමාජභාවය සම්බන්ධ සිංහල භාෂාවෙන් රචිත කෘති අල්පය.

මෙම අධ්‍යයනවලට අමතරව ''සමාජ විද්‍යාඥයන්ගේ සංගමය'' (Social Scientists Association) විසින් ස්ත්‍රිය විෂයයෙහි එළි දක්වන ලද ප්‍රකාශන ගණනාවක් දක්නට ලැබේ.

- පිතෘ මූලිකත්වය යනු කුමක්ද (කම්ලා භාසින්)
- කාන්තා අයිතීන්/ මානව අයිතීන් දෙස ප්‍රතිසංස්කරණාත්මක බැලීමක් (චාලට් බන්ච්)
- ස්ත්‍රීවාදය හා ජාතිකවාදය (කුමාරි ජයවර්ධන)

මේ අතර වැදගත් වේ.

2003 දී කාන්තා අධ්‍යයන හා පර්යේෂණ කේන්ද්‍රය ප්‍රකාශයට පත්කළ නිලූෆ ද මැල් සහ මිනෝලි සමරක්කොඩි විසින් රචිත "writing and inheritance ; women's writing in Sri Lanka (1860-1948) කෘතිය ශ්‍රී ලාංකේය ග්‍රන්ථකරණයෙහි ස්ත්‍රී දායකත්වය විමසයි.

ආසියානු පර්යාවලෝකයෙහි ස්ත්‍රීවාදය පිළිබඳ සාකච්ඡා කරන ගුරුකුල අතර සමාජ ඉතිහාසඥයන් සහ සමාජ විද්‍යාඥයන් දැකිය හැකිය.

ඥානසිරි ද සිල්වා විසින් 2004 වර්ෂයේදී ''දර්ශනය හා කාන්තාවː කාන්තා විමුක්ති සංකල්පය පිළිබඳ නව දෘෂ්ටිකෝණයකින්'' නම් කෘතිය පළ කර තිබේ.

සාහිත්‍ය විමර්ශනයේ දී ස්ත්‍රීවාදය හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ න්‍යායාත්මක දැනුම ලබා ගැනීම සඳහා පහත සඳහන් කෘති පරිශීලනය කෙරිණි.

garrett Stephanie - GENDER
J.Archer & B Lioyd - Sex and Gender
Freedman Jademan - Feminism
Gillbert Sandra and Gubar Susan – The Mad Woman in the Attic

ශ්‍රී ලංකාවේ කාන්තාවන් පිළිබඳ පර්යේෂණවලට ප්‍රමුඛත්වයක් දෙන ආයතන කිහිපයක් අද වන විට දැකිය හැකිය. මෙම සංවිධාන අතර,

- කාන්තාවන් පිළිබඳ පර්යේෂණ කේන්ද්‍රය (CENWOR)
- මුස්ලිම් කාන්තාවන් පිළිබඳ පර්යේෂණ ආයතනය (MWRAF)
- කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රය (WERC)
- ජනවාර්ගික අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර ආයතනය (ICES)
- මූලික අධ්‍යයන ආයතනය (IFS)
- නීතිය හා සමාජභාරය (LST)
- සමාජ විද්‍යාඥයන්ගේ සංගමය (SSA) ප්‍රමුඛ වේ.

ශ්‍රී ලංකාවේ කාන්තාව පිළිබඳ පර්යේෂණ සඳහා දිශානුගත මෙම ආයතනමය ප්‍රකාශන මඟින් වැඩිදුර අධ්‍යයන කටයුතු සිදුවී ඇත්තේ සමාජ, සංස්කෘතික, දේශපාලන, නීතිය, විෂයානුබද්ධ කරුණුය. මෙම සීමිත අධ්‍යයන තුළින් ද නූතන

සිංහල සාහිත්‍යය පිළිබඳ ලියවී ඇති දෑ අල්පය. මෙම අධ්‍යයනයේදී මාතෘකාව තෝරා ගැනීමේ සිට එය නිම කිරීම දක්වා ගැටලු සහ සීමාකම්වලට මුහුණ දීමට සිදු විය.

ලංකාවේ වර්තමානය වන විට ස්ත්‍රී අධ්‍යයනය පිළිබඳ වැඩි අවධානයක් යොමු වී ඇත. මෙම පර්යේෂණාත්මක පසුබිම ස්ත්‍රීවාදය හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය සමග බැඳී පවතී. එය මෙම පර්යේෂණාත්මක කර්තව්‍ය සඳහා බෙහෙවින් ඉවහල් විය. එහෙත් මෙයට ලාංකේය සාහිත්‍යය හා සමග පවත්නා සම්බන්ධය බෙහෙවින් අඩුය. කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රයේ ප්‍රකාශනයක් වන “නිවේදනී” සඟරාව මේ සඳහා යම් දායකත්වයක් සපයයි. මෙම පර්යේෂණයේ දී මුහුණ දුන් ප්‍රධානම ගැටලුව එය විය.

මෙම අධ්‍යයනය සඳහා තෝරා ගත් න්‍යායාත්මක රාමුව වන ස්ත්‍රීවාදය අදටත් ලාංකේය සන්දර්භය පිළිගත්තක් නොවේ. වැරදි වටහාගැනීම්, ප්‍රතික්ෂේප කිරීම්, සහිත මතවාදයක් ලෙස ස්ථාපනය වී ඇත. තෝරා ගත් සිංහල නවකතාවන්හි ද ලේඛිකාවන්ගේ පෞද්ගලික අදහස්වලින්ද මෙම මතය තහවුරු විය. ඉහත සඳහන් කළ අධ්‍යයනවලින් වෙනස් වූ, අත්‍යවශ්‍ය වූ විෂය ක්ෂේත්‍රයක් මෙම නිබන්ධනයට පාදක කර ගැනිණ.

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය සඳහා ලේඛක ලේඛිකාවන් තෝරා ගැනීම ගැටලු සහගත විය. නවකතාකරණයෙහි යෙදෙන ලේඛිකාවන් ප්‍රමාණාත්මකව අඩු බැවින් වර්තමානය වන විට ඒ සඳහා සක්‍රීයව දායකත්වය දී ඇති දහ දෙනෙකුගේ කෘති යොදා ගැනිණ. ඒ අනුව ඔවුන් විසින් රචනා කරන ලද සියලුම නවකතා සාකච්ඡාවට ලක් කෙරිණ. සිංහල නවකතාවේ විකාශනයේදී පැහැදිලි අවධානයට ලක් කෙරුණු නවකතා රචනා කළ ලේඛකයන් දහ දෙනෙකුගේ කෘති ද පර්යේෂණ සඳහා ප්‍රස්තුත කර ගැනිණ.

මේ අනුව පළමුව අධ්‍යයන පසුබිම, පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණ, එහි වැදගත්කම, අධ්‍යයන ක්‍රමවේදය, පර්යේෂණයේ සීමාකම්, පරිච්ඡේද සංවිධාන සඳහා හැඳින්වීමක් සිදු කෙරේ. පළමු පරිච්ඡේදයෙන් අධ්‍යයනයට අවශ්‍ය ප්‍රවේශය සකසාගැනීම සඳහා ස්ත්‍රී පුරුෂභාවය නම් ජීවවිද්‍යාත්මක සාධකය පදනම් කර ගෙන සමාජ විද්‍යාත්මක සම්බන්ධතා නිසා සැකසී ඇති සමාජ සංස්කෘතික ප්‍රභේදයක් වශයෙන් “ස්ත්‍රීපුරුෂ සමාජභාවය” හඳුනා ගැනේ. එම ස්ත්‍රීපුරුෂ සමාජභාවීය සම්බන්ධතා මත කාන්තාව අයිතිවාසිකම් අහිමි කිරීමට ලක්ව සිටින බව ස්ත්‍රීවාදීන්ගේ විග්‍රහයයි. එම ස්ත්‍රීවාදී දර්ශන න්‍යායන් මත පදනම් වෙමින් “ස්ත්‍රීවාදය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය” පර්යේෂණාත්මක අධ්‍යයනයකට යොමු කෙරේ. සාහිත්‍යය පෝෂණය වනුයේ සමාජයේ පවතින පුද්ගල හා නිෂ්පුද්ගල බලවේගයන් මගිනි. සාහිත්‍යය ක්‍රියාත්මක වනුයේ ද වෙනත් වැදගත් සමාජ සංස්ථාවක් පරිද්දෙනි. එමෙන්ම එය පාඨකයාගේ සහභාගිත්වයෙන් නිපදවන සාහිත්‍ය කතිකාවකි. ජීවිතය පිළිබඳ ඍජු

චිත්‍රයක් නිපදවන සංස්කෘතියේ සංකේතාත්මක ප්‍රකාශනයකි. එම නිසාම මෙතෙක් කිසිදු ආකාරයක පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදුකෙරී නැති නවකතාව නැමති කලා මාධ්‍ය ඉහත සඳහන් විෂය ඇසුරින් සාකච්ඡාවට භාජනය කෙරේ.

දෙවනුව සිංහල නවකතාවේ මුල්කාලීන නිර්මාණවල අන්තර්ගතය ඇසුරින් ස්ත්‍රීපුරුෂ සමාජභාවය විග්‍රහ කෙරේ. මෙම න්‍යායාත්මක අර්ථකථන සාකච්ඡාවට ලක් කිරීමට පෙර සිංහල නවකතාවේ මුල් අවදියේ නිර්මාණ පිළිබඳව මෙහි දී අවධානය යොමු කෙරේ. එහි දී සයිමන් ද සිල්වා, පියදාස සිරිසේන, ඩබ්.ඒ. සිල්වා, මාර්ටින් වික්‍රමසිංහ, වැනි සිංහල නවකතාවේ අභිවර්ධනයට දායක වූ මුල්කාලීන නවකතාකරුවන්ගේ නිර්මාණ සලකා බැලේ.

තුන්වෙනුව මෙම පර්යේෂණාත්මක නිබන්ධය සඳහා තෝරා ගත් ලේඛක ලේඛිකාවන් සහ ඔවුන්ගේ නිර්මාණවල ප්‍රස්තුතයන් සාකච්ඡා කෙරේ. එහි දී ඔවුන්ගේ නිර්මාණවල තේමාත්මක පසුබිම ඉස්මතු කිරීමට අපේක්ෂිතය.

හතරවෙනුව 1960-2000 දක්වා කාලයෙහි ඉහත සඳහන් ලේඛක ලේඛිකාවන් විසින් රචනා කරන ලද නවකතාවල නිරූපිත ස්ත්‍රීපුරුෂ සමාජභාවය ස්ත්‍රීවාදී එළඹුමක් සහිතව පුළුල් විග්‍රහයකට බඳුන් කෙරේ. ඒ අනුව ස්ත්‍රීත්වය - සමාජ සංස්කෘතික සිද්ධාන්ත, ආගමික ඉගැන්වීම්, සමාජ ආකල්ප, අධ්‍යාපනය, දේශපාලනය, නීතිය, ඉතිහාසය, ආර්ථිකය, ආගම යන නිර්ණායකවලට වර්ග කර විමසා බැලේ.

පස්වෙනුව ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණවල දෘෂ්ටිමය පරස්පරතා විමසා බැලේ. තමන්ගේ නිර්මාණවල පවත්නා අදහස්වලට පෞද්ගලිකත්වය කර ඇති බලපෑම කවරාකාර ද? එයට ස්ත්‍රීපුරුෂභාවය බලපා තිබේ ද? විදේශීය ලේඛකයන්ගේ නිර්මාණවල ආභාසය ලබා තිබේ ද? ස්ත්‍රීවාදී චින්තනය බලපෑමක් කර ඇත්ද? යනාදී කරුණු විමසීමට අපේක්ෂිතය.

කෘතිවල නාමයන් සහ උපුටා දැක්වීම්වල දී එම කෘතිවල පැවති අයුරින්ම භාෂාව භාවිත කළ බව සඳහන් කළ යුතුය.

මෙම සියලු අධ්‍යයනයන් මත අවසාන වශයෙන් සමාලෝචනය ඉදිරිපත් කෙරේ. මෙතෙක් සිදු කරන ලද පර්යේෂණාත්මක අධ්‍යයනයේ පර්යේෂණාත්මක සොයා ගැනීම් සංක්ෂිප්තව විග්‍රහ කිරීමට අදහස් කෙරේ.